www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

| 87 | S | I |
|---|---|---|

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 10 – Second Term Evaluation – January 2022
දෙවන වාර පරීක්ෂණය – 2021 ( 2022 ) –10 ශ්‍රේණිය

කාලය : පැය 1
Time: 1 hour

## Communication & Media Studies – I
සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය – I

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(01) ප්‍රංශයේ ලැස්කෝ ලෙන්, අප්‍රිකාවේ කල්හාරි යනාදි සිතුවම් මගින් පෙන්වන්නේ ප්‍රාථමික සන්නිවේදනයේ,
i. විධිමත් ස්වරූපයයි. iii. දෘශ්‍ය ස්වරූපයයි.
ii. ලිඛිත ස්වරූපයයි. iv. අසංථ්‍ය ස්වරූපයයි.

(02) සන්නිවේදනය ක්‍රියාවලියකි. එය පවත්වාගෙන යාමට අවශ්‍ය ම අංගය වන්නේ,
i. සන්නිවේදකයා ii. මාධ්‍ය iii. පණිවුඩය iv. ග්‍රාහකයා

(03) කාය භාෂා විධික්‍රම බහුලව ම භාවිතා කරමින් සිදු වන සන්නිවේදන ස්වරූපයක් වන්නේ,
i. නිර්වාදික සන්නිවේදනය iii. අන්තර් පුද්ගල සන්නිවේදනය
ii. අවිධිමත් සන්නිවේදනය iv. අන්තර්වර්ති සන්නිවේදනය

(04) සන්නිවේදනයේ මූලික අරමුණ ග්‍රාහකයා තුළ ආකල්පමය හෝ චර්යාමය වෙනසක් ඇති කිරීමයි. මෙය විග්‍රහ වන මූලික අංගය,
i. මාධ්‍ය ii. ග්‍රාහකයා iii. පණිවිඩය iv. බලපෑම්

(05) සිත හසුරුවා ගැනීමට වඩාත් උපකාරි වන සන්නිවේදන ප්‍රභේදයක් වන්නේ,
i. සන්නිවේදනය අන්තර් පුද්ගල සන්නිවේදනය iii. ජන සන්නිවේදනය
ii. අන්තර්වර්ති සන්නිවේදනය iv. සමූහ සන්නිවේදනය

(06) ජනමාධ්‍ය තොරතුරුවල නිරන්තරයෙන් ම දැකිය හැක්කේ,
i. විනෝදාස්වාදයයි ii. දෛනිකත්වයයි iii. සංකීර්ණත්වයයි iv. අධ්‍යාපනයයි

(07) සන්නිවේදනයේ ද්වී ග්‍රාහක ස්ථානය
i. තනි පුද්ගලයෙකි (iii) තනි පුද්ගලයෙක් , කණ්ඩායම් හෝ ආයතනයකි
ii. තනි පුද්ගලයෙක් හෝ ආයතනයකි (iv) කණ්ඩායමක් හෝ ආයතනයකි



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

(08) සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍යයන්වලට වඩාත් සමීප සන්නිවේදන ක්‍රම පමණක් ඇතුළත් වන්නේ,

i. සලකුණු කිරීම්, කාටූන් හා ගින්දර
ii. මාර්ග සංඥා, කොළ අතු
iii. චිත්‍ර, ගින්දර හා ලේකම් මිටි
iv. ගින්දර, දුම් හා කොළ ඇතු එල්ලීම

(09) අමල් පුවත්පත් ආයතනයක ලේඛකයෙකු ලෙස කටයුතු කරයි. ඔහුගේ රැකියාව හා සම්බන්ධ සන්නිවේදන වර්ගය වනුයේ,

i. ලිඛිත සන්නිවේදනයයි
iii. අන්තර්වර්තී සන්නිවේදනයයි
ii. ජන සන්නිවේදනයයි
iv. නිර්වාචික සන්නිවේදනයයි

(10) නිර්වාචික සන්නිවේදනය වඩාත් ප්‍රබලම හා කලාත්මකව ඉදිරිපත් කළ හැක්කේ,

i. සිනමාවේදී ය.
iii. පුවත්පතේදී ය.
ii. iii. ගුවන්විදුලියේදී ය.
iv. රූපවාහිනියේදී ය.

(11) සන්නිවේදනයෙන් සිදුකරනු ලබන වැදගත්ම සමාජ මෙහෙවර නම්,

i. ප්‍රජාව අතර අන්තර් සබඳතා ගොඩ නැගීමයි
ii. ග්‍රාහකයා වෙත තොරතුරු ගෙන යාමයි
iii. පුළුල් ප්‍රජාවත් වෙත තොරතුරු ගෙන යාමයි
iv. අදහස් පොදු බවට පත් කිරීමේ ක්‍රියාවලියයි

(12) කණ්ඩායම් සන්නිවේදනයේ දී සිය සන්නිවේදන හැකියාව වඩාත් හොඳින් ඉස්මතු වීමට අවම ඉඩක් ඇත්තේ,

i. සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාව
ii. එක් එක් පුද්ගලයා සතු පෞරුෂය හා පෙනුමයි
iii. සන්නිවේදන නිපුණතා පිළිබඳව ඇති විෂය දැනුමයි
iv. අන්‍ය මත ඉවසීමේ හැකියාවයි

(13) භාෂාවේ අකුරු ලිවීම මගින් සන්නිවේදනය සිදු කිරීමේදී සැලකිය යුතු කරුණක් වීමට අවම ඉඩක් ඇත්තේ,

i. සාහිත්‍යය ලේඛනවලදී නිර්මාණශීලීත්වය කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම
ii. ලේඛනයෙහි අන්තර්ගතය පැහැදිලිව මෙන්ම නිරවුල්ව ඉදිරිපත් කිරීම
iii. ඉලක්ක ග්‍රාහකයාගේ භාෂා ව්‍යවහාර ය කෙරෙහි අවධානය යොමු කිරීම
iv. ලේඛන ආකෘතිවල පවතින වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කිරීම

(14) පන්ති කාමර ඉගැන්වීම්, ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශය, පුවත්පත් දැන්වීම් හා වේදිකා නාට්‍ය යන ඒවායෙහි සන්නිවේදන අරමුණු අනුපිළිවෙළින් දක්වා ඇති වරණය වන්නේ,

i. තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාදය පෙළඹවීම
ii. අධ්‍යාපනය ලබා දීම තොරතුරු සම්පාදනය පෙළඹවීම්, විනෝදාස්වාදය
iii. අධ්‍යාපනය ලබාදීම, පෙළඹවීම , තොරතුරු සම්පාදනය , විනෝදාස්වාදය
iv. අධ්‍යාපනය ලබාදීම, පෙළඹවීම, තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

(15) **නිරාෂා - ''සන්නිවේදන වර්ගීකරණය සිදු වී ඇත්තේ එහි ප්‍රතිපෝෂණ ක්‍රියාවලියේ හීනවීම මතය.''**
**සුලක්ෂි -''සන්නිවේදනය වර්ගීකරණය ඊට සහභාගී වන ග්‍රාහක ප්‍රමාණය අනුව හඳුනාගත හැකිය.''**

සන්නිවේදන වර්ගීකරණයට අදාළව ඉහත දෙදෙනාගේ ප්‍රකාශවලින්,

i. නිරාෂාගේ ප්‍රකාශය සත්‍ය වන අතර සුලක්ෂිගේ ප්‍රකාශය අසත්‍ය වේ.
ii. නිරාෂාගේ ප්‍රකාශය අසත්‍ය වන අතර සුලක්ෂිගේ ප්‍රකාශය සත්‍ය වේ.
iii. නිරාෂාගේ ප්‍රකාශය හා සුක්ෂිගේ ප්‍රකාශය සත්‍ය වේ
iv. දෙදෙනාගේ ම ප්‍රකාශය හා සුලක්ෂිගේ ප්‍රකාශය සත්‍ය වේ

(16) එක්තරා මැතිවරණයකදී '' .................... අංකයට ඔබේ මනාපය දෙන්න.'' යනුවෙන් ඔහුගේ රුව රැගත් බැනරයක් නගරයේ සෑම තැනකම ප්‍රදර්ශනය කර තිබුණි. සන්නිවේදන ක්‍රියාවලිය,

i. නිර්වාචික ය. ii. දේශපාලනික ය. iii. දෘශ්‍යය . iv. අවිධිමත් ය.

(17) එක්තරා ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් ද සිදුකරන ලද්දේ (Call confenrence (එක් දුරකථනයකින් දුරකථන කිහිපයකට සම්බන්ධ විය හැකි) පහසුකම් ඇති ජංගම දුරකථන හරහාය. මෙම සන්නිවේදන ක්‍රමය,

i. ජනමාධ්‍යයක් වන අතර විධිමත් හා පුද්ගලාන්තරය
ii. ශ්‍රව්‍ය මාධ්‍යයක් වන අතර අවිධිමත් හා සමූහය
iii. වාචික මාධ්‍යයක් වන අතර අවිධිමත් හා සමූහය
iv. නව මාධ්‍යයක් වන අතර විධිමත් හා සමූහය

(18) පසුගිය දිනයේ සිදු වූ ආයතනයේ සිදු වූ කාර්මික දෝෂය පිළිබඳ දැනුවත් කිරීමට, කාර්මික අංශයේ ම නිලධාරියෙක් විසින් කාර්මික අංශයේ අනෙකුත් නිලධාරීන් කැඳවීය.
ඉහත සිදුවීම් අයත් වන්නේ,

i. හරස් හා විධිමත් සන්නිවේදනයට ය.
ii. අවිධිමත් සන්නිවේදනයට ය.
iii. විධිමත් සන්නිවේදනයට ය.
iv. විධිමත් පර්ෂද දාමයට ය.

(19) අන්තර් පුද්ගල සන්නිවේදනයේදී යොදාගැනීමට අවම ඉඩක් ඇති සන්නිවේදන මෙවලමකි.

i. තැපැල් ලිපි ii. විද්‍යුත් තැපැල iii. ෆැක්ස් පණිවුඩ iv. අත් පත්‍රිකා

(20) යම් සන්නිවේදන ක්‍රියාවලියක දී භාෂාවේ මූලික ම කාර්යය වන්නේ,

i. සිතීම විධිමත් කිරීම
ii. සැබෑම හඳුනා ගැනීම
iii. වාචික ප්‍රකාශනය
iv. ඉහත සියල්ල ම

(21) අමිල් විසින් විමල්ට ද, විමල් සුනිල්ට ද, සුනිල් කමල්ට ද, ආදි වශයෙන් පන්තියේ සිදුවීමක් ගැන තොරතුරු පැතිර ගිය අතර නැවත එය අමිලට අසන්නට ලැබුණි. මෙම සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් හොඳින් විවරණය කළ හැකි සන්නිවේදන ආකෘතිය,

i. දාම ආකෘතිය ii. චක්‍රීය ආකෘතිය iii. වයි ආකෘතිය iv. රෝද ආකෘතිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

(22) මුද්‍රණ ශිල්පය සොයාගනු ලැබුවේ,

i. චීන ජාතිකයන් විසිනි
ii. ප්‍රංශ ජාතිකයින් විසිනි
iii. ජර්මානුවන් විසිනි
iv. ඇමරිකානුවන් විසිනි

(23) කම්බියක් ඔස්සේ හඬ යැවීමේ දුරකථන ක්‍රමය සොයා ගනු ලැබුවේ,

i. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් විසිනි
ii. ජෝන් ලොගී බෙයාඩ් විසිනි
iii. ජොහැන්ස් ගුටෙන්බර්ග් විසිනි.
iv. ගුග්ලි එල්මො මාර්කෝනි විසිනි

(24) පාරමී, වාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනයට ගත ක්‍රියාමාර්ග දක්වා තිබුණේ පහත පරිදි ය.

A කථන රටා පුහුණු වීම
B සවන් දීමට පුහුණු වීම
C කථනය සඳහා පෙර සූදානම
D අන්‍යයන්ගේ කථා හා අංග චලනය අනුවර්තනය කිරීම

ඉහත කරුණු අතරින් නිවැරදි කරුණු පමණක් අඩංගු පිළිතුර තෝරන්න

i. A පමණි
ii. A, B, C පමණි
iii. A, B පමණි
iv. A, B,C හා D යන සියල්ලම

(25) අවාචික සන්නිවේදනය පිළිබඳ කතා බහකදී ප්‍රකාශ වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

A. අවාචික සන්නිවේදනය සමාජීය, පාරිසරික හා ශාරීරික සාධක ලෙස වර්ග කරන්න පුළුවන්
B. පුද්ගලයෙක් තවත් පුද්ගලයෙක් සමග කතා බහ කරද්දී ඔවුන් අතර පවතින දුර අනුව සාමාජීය සාධක හඳුනාගන්න පුලුවන්
C. දූ දරුවන්, සහෝදර සහෝදරියන්, අඹු සැමියන්, දෙමාපියන් හා දූ දරුවන් අතර තියෙන්නේ සාමාජීය අවකාශයක්
D. පෞද්ගලික අවකාශයේ ඉන්නේ සාමාන්‍ය ජනයා , සාමාජීය අවකාශයේ ඉන්නේ ගනුදෙනුකරුවන් , පොදු අවකාශයේ ඉන්නේ යහළුවන්

ඉහත කරුණු අතරින් නිවැරදි කරුණු පමණක් අඩංගු පිළිතුර තෝරන්න

i. A පමණි
ii. A, B පමණි
iii. A, B, C පමණි
iv. A, B,C හා D යන සියල්ලම

(26) ඔබ විසින් ලබාගත් ඡායාරූපයක් විදේශ රටකට යැවීමට සුදුසුම ක්‍රමය වන්නේ,

i. කුරියර් සේවාවයි.
ii. ශීඝ්‍රගාමී තැපෑලයි.
iii. විද්‍යුත් තැපෑලයි.
iv. ෆැක්ස් පණිවිඩ ක්‍රමයකි.

(27) සිරිපාල හා රන්මැණිකා යන දෙදෙනා ෆේස්බුක් තුළින් ප්‍රේම සම්බන්ධයක් ආරම්භ කර ඇති බව ඕපනායක නැන්දා විසින් ගමේ හැමෝටම පතුරුවන ලදි. ඉහත සිද්ධිය වඩාත් හොඳින් ගැළපෙන්නේ,

i. පිළිගත් සන්නිවේදනය ක්‍රියාවලියට ය.
ii. සාම්ප්‍රදායික සන්නිවේදනය ක්‍රියාවලියට ය.
iii. ඕපාදූප දාමයට ය.
iv. දාම ආකෘතියට ය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

(28) කණ්ඩායම් සන්නිවේදනයට සාපේක්ෂව අන්තර් පුද්ගල සන්නිවේදනයේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ,

i. සන්නිවේදකයා භාෂාව යොදාගැනීමයි
ii. ග්‍රාහකයා හොඳින් ශ්‍රවණය කිරීමයි
iii. සන්නිවේදක හා ග්‍රාහක භූමිකාව ස්ථාරවර වීමයි
iv. නිර්වාචික සන්නිවේදනය ප්‍රබල වීම

(29) ලිඛිත සන්නිවේදනය සඳහා මානවයා පෙළඹුණේ,

i. විනෝදාස්වාදය ලැබිය හැකි නිසා ය.
ii. කඩදාසි සොයාගත් නිසා ය.
iii. කථන සන්නිවේදනයේ සීමා නිසා ය.
iv. භාෂාව බිහි වූ නිසා ය.

- **ඉහත සඳහන් සිද්ධිය ඇසුරින් 30 සිට 32 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(30) **ඔබට මව කථා කොට සති අන්ත පුවත්පතක් බැලීමට යොමු කරයි. එහි තිබුණු එක්තරා පිටසක්වල ජීවීන් පිළිබඳ එක්තරා සිදුවීමක් ගැන කල්පනා කරමින් සිටින විට නිවසට පැමිණි මිතුරන් වෙත ඔබ එහි වැදගත් කරුණු විස්තර කර දෙන්නේ යැයි සිතමු.**

i. ජන - ශ්‍රව්‍ය වේ
ii. සමූහ වාචික වේ
iii. පුද්ගලාන්තර ශ්‍රව්‍ය වේ
iv. පුද්ගලාන්තර නිර්වාචික වේ

(31) මෙහිදී ඔබ පිටසක්වල ජීවීන් ගැන කල්පනාවේ නිමග්න වීම සන්නිවේදනයේදී,

i. අන්තර්වර්තී සන්නිවේදනයයි
ii. පුද්ගලාන්තර සන්නිවේදනයයි
iii. සමූහ සන්නිවේදනයයි
iv. පුවත්පත් සන්නිවේදනයයි

(32) මෙම සිද්ධියේ සන්නිවේදන අනුපිළිවෙළ මින් කුමක් ද?

i. පුද්ගලාන්තර, සමූහ, ජන අන්තර්වර්තීය.
ii. පුද්ගලාන්තර, අන්තර්වර්තී, ජන සමූහ ය.
iii. පුද්ගලාන්තර, ජන, අන්තර්වර්තී සමූහ ය.
iV. පුද්ගලාන්තර, සමූහ, අන්තර්වර්තී ජන ය.

(33) සරලා සාහිත්‍ය සමිතියේදී විවිධ මාධ්‍ය මෙවලම් භාවිත කරමින් සිදු කළත් එම දේශනය වැඩි දෙනෙක් අසා සිටි එකක් නොවේ. එසේ වීමට අවම ඉඩක් ඇත්තේ,

i. දේශනය ග්‍රාහකයින්ට අදාළ නොවීම
ii. හඬ සියලු දෙනා නොඇසී යාම
iii. කතාව අතරතුර විදුහල්පතිවරයා දේශන ශාලාවට පැමිණීම
iv. වෙනස් බාහිර බාධක ඇතිවීම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලු ම හිමිකම් ඇවිරිණී / All Rights Reserved

(34) සිය මව දුටු බිළිදෙකුගේ මුහුණෙහි සෙනෙහස් හැඟීම් මතු විය. මෙහිදී බිළිදාගේ සිතෙහි පහළ වූ හැඟීම් ප්‍රකාශ කෙරුණේ,

i. වාචික සන්නිවේදනයෙනි. ii. ශ්‍රව්‍ය සන්නිවේදනයෙනි.
iii. නිර්වාචික සන්නිවේදනයෙනි. iv. දෘෂ්‍ය සන්නිවේදනයෙනි.

(35) නවකතාවක චරිතයක ආත්ම කථනයේ යෙදේ නම්, එහිදී භාවිතා වන සන්නිවේදන වර්ගය

i. පුද්ගලාන්තර සන්නිවේදනයයි. ii. අන්තර්වර්තී සන්නිවේදනයයි.
iii. සමූහ සන්නිවේදනයයි. iv. ජන සන්නිවේදනයයි.

(36) ''ඔබේ අදහස් මෙයට දමන්න'' යනුවෙන් ලියූ පෙට්ටියක් ආයතනයක කාර්යාලය ඉදිරිපිට තබා ඇත. එය,

i. පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් වේ.
ii. ලිඛිත සන්නිවේදනයට අයත් වේ.
iii. අවිධිමත් සන්නිවේදනයට අයත් වේ.
iv. පහළින් ඉහළට සිදුකරන විධිමත් සන්නිවේදනයට අයත් වේ.

(37) යම් සංවිධානයක ආරම්භකයා විසින් යම් අදහසක් තමා තෝරාගත් කිහිප දෙනෙකුට ලබා දෙයි. ඔවුන් විසින් ද එම අදහස ලබා දෙන්නේ තෝරා ගත් කිහිප දෙනෙකුට පමණි. මෙවැනි තත්වයක් හැඳින්විය හැක්කේ,

i. පර්ෂද දාමය ලෙසිනි. ii. සම්භාවිතා දාමය ලෙසිනි.
iii. ඕපදූප දාමය ලෙසිනි. iv. සුහද දාමය ලෙසිනි.

(38) සිය මව දුටු බිළිදෙකුගේ මුහුණෙහි සෙනෙහස් හැඟීම් මතු විය. මෙහි දී බිළිදාගේ සිතෙහි පහළ වූ හැඟීම් ප්‍රකාශ කෙරුණේ,

i. වාචික සන්නිවේදනයෙනි. ii. ශ්‍රව්‍ය සන්නිවේදනයෙනි.
iii. නිර්වාචික සන්නිවේදනයෙනි. iv. දෘශ්‍ය සන්නිවේදනයෙනි.

(39) පන්ති කාමරය තුළ මාධ්‍ය උපකරණ භාවිතය අවශ්‍ය වන්නේ,

i. විවිධ රූප සටහන් හා ඡායාරූප ආදිය පහසුවෙන් පෙන්වීමට ය
ii. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායි කිරීමට ය
iii. කථනය සමඟ දෘශ්‍ය මාධ්‍ය යොදා ගැනීමට ය.
iv. ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය පහසු කර ගැනීමට ය.

(40) ඔබේ පවුලේ සාමාජිකයින් සමග රූපවාහිනිය නරඹන ඔබ සම්බන්ධ වී සිටින සන්නිවේදන වර්ගය හා ස්වරූපය වන්නේ,

i. සමූහ - අවාචික සන්නිවේදනය
ii. සමූහ - අවිධිමත් සන්නිවේදනය
iii. ජන - ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනය
iv. ජන - අවාචික සන්නිවේදනය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 87 | S | II |
|---|---|---|

**Grade 10 – Second Term Evaluation – January 2022**

කාලය : පැය 1
Time: 1 hour

**දෙවන වාර පරීක්ෂණය – 2021 ( 2022 ) –10 ශ්‍රේණිය**

Communication & Media Studies – II

සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය – II

- **පළමු ප්‍රශ්නය (අනිවාර්ය) සහ තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) කිසියම් කෙනෙක්, යම් කිසිවක් , යම් නාලිකාවක්, යම් කෙනෙකුට, යම් බලපෑමක් සඳහා ඉදිරිපත් කරන ලද දෙය සන්නිවේදනයයි.

(i) ඉහත සඳහන් නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ii) මෙහි ''යම් කිසිවක් '' යන්න අර්ථ දක්වන්න

(iii) ජන සන්නිවේදනයේ ධනාත්මක බලපෑම් දෙකක් ලියන්න

(iv) ඕනෑම පුද්ගලයෙකු අනිවාර්ය සන්නිවේදයෙකු වන්නේ කුමන සන්නිවේදන වර්ගය තුළ ද ?

(v) ඒක මාර්ගික සන්නිවේදන ආකෘති දෙකක් නම් කරන්න

(vi) ජන සන්නිවේදන ක්‍රියාවලියට අදාළ ''දොරටුපාල සංකල්පය'' අර්ථ දක්වන්න

(vii) ''සංජානනය'' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(viii) සාම්ප්‍රදායික මාධ්‍ය භාවිතා කිරීමේ දී ඇති වූ සන්නිවේදන බාධක දෙකක් සඳහන් කරන්න

(ix) සන්නිවේදනයේ ඓතිහාසික වර්ධනය තුළ සිදු වූ වැදගත් සිද්ධි දෙකක් ලියා දක්වන්න

(x) ''භාෂා ද්වීරූපතාව'' යනු කුමක් ද?

**(ලකුණු 2 x 10)**

(02) (i) සෑම සන්නිවේදන ක්‍රියාවලියක ම අවසාන ප්‍රතිඵලය පුද්ගලාන්තර ස්වභාවයක් ගනී. අන්තර් පුද්ගල සන්නිවේදනය යනුවෙන් අදහස්, වන්නේ කුමක් ද?

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් උදාහරණ සහිත ව කෙටියෙන් විස්තර කරන්න

(iii) ''ප්‍රතිපෝෂණය'' යන්න අර්ථ දක්වා, ප්‍රතිපෝෂණ ක්‍රියාවලියේ වැදගත්කම් දෙකක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න

(iv) දේශනයකදී කාය භාෂාව භාවිතා කළ හැකි ආකාර හතරක් කෙටියෙන් විස්තර කරන්න. අවිධිමත් සන්නිවේදනය සිදුවන ආකාර දැක්වෙන ආකෘති හතරක් පැහැදිලි කරන්න

**(ලකුණු 10)**



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

(04) පහත දැක්වෙන්නේ 1949 දී ගණිතඥයින් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද සන්නිවේදන ආකෘතියකි. ඒ ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආකෘතිය

(i) ඉහත සඳහන් සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කළ පුද්ගලයින් දෙදෙනා නම් කරන්න

(ii) x හා y සඳහා යෙදිය යුතු වචන මොනවාද ?

(iii) මෙම ආකෘතියේ හඳුනාගත හැකි ප්‍රබලතා දෙකක් හා දුබලතා එකක් සඳහන් කරන්න

(iv) ද්වි මාර්ගික සන්නිවේදන ක්‍රියාවලිය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න

(ලකුණු 10)

(05) ජන සන්නිවේදනය ආදි මානවයා විසින් කිසිසේත් අපේක්ෂා කරන ලද්දක් නොවේ. එය සිදු වූයේ තාක්ෂණික දියුණුව නිසාය.

(i) ජන සන්නිවේදනය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(ii) ජන මාධ්‍ය සඳහා යොදා ගත හැකි උදාහරණ 04 ක් සඳහන් කරන්න

(iii) ජන සන්නිවේදනයේ මූලික ස්වභාවය කරුණු තුනක් මගින් කෙටියෙන් පෙන්වා දෙන්න

(iv) ජන මාධ්‍ය හා සමාජය අතර ඇත්තේ සමීප සබඳතාවයකි. ජන සන්නිවේදනය නූතන සමාජයට සිදුකරන බලපෑම කරුණු හතරක් මගින් පැහැදිලි කරන්න

(ලකුණු 10)

(06) පුද්ගල සංඛ්‍යාව අනුව සන්නිවේදන ක්‍රියාවලිය වර්ග කර දැක්විය හැකිය.

(i) සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භ වන්නේ කවර සන්නිවේදන වර්ගයකින් ද?

(ii) ඉහත ඔබ සඳහන් කළ සන්නිවේදනයේ යෙදෙන අවස්ථාවක තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි නාලිකා හතරක් දක්වන්න

(iii) ඔබ උදෑසන රැස්වීමේදී ''ප්‍රදීපාගාර උපක්‍රමය'' යොදා ගනිමින් කතාවක් ඉදිරිපත් කරන්නේ යැයි සිතන්න. එය භාවිතා කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න

(iv) සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක් කෙටියෙන් විස්තර කරන්න

(ලකුණු 10)

(07) පුද්ගලයින් සන්නිවේදන කාර්යයේදී විවිධ ක්‍රමශිල්ප අනුගමනය කරනු ලබයි.

(i) සන්නිවේදන ක්‍රියාවලියේදී භාවිතා කරන සන්නිවේදන ස්වරූප දෙකක් නම් කරන්න

(ii) වාචික සන්නිවේදනයේ දී කථිකයාගේ අවධානය යොමු විය යුතු අංග හතරක් නම් කරන්න

(iii) වාචික හා ව්‍යවහාරයට වඩා ලිඛිත භාෂා ව්‍යවහාරය විධිමත්ව යන්න තහවුරු කිරීමට කරුණු හයක් සඳහන් කරන්න

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk